# රජයේ නිවේදන

එල්.ඩී. බී. 2/2000.

## 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 17 සහ 18 යන වගන්ති සමග කියවිය යුතු 34 වැනි වගන්තිය යටතේ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සමාජ සේවා අමාත්‍ය.

කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2012 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සැලසීමේ අපේක්ෂිත යම් ආයතනයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ කටයුතුවල නිරත වී සිටින සෑම තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් ම අදාළ ආයතනය තුළ වැඩිහිටි තැනැත්තන් පස්දෙනෙකුට වඩා නේවාසිකව සිටින්නේ නම්, වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සලසන එවැනි ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා වහාම ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම පනතේ 16 සහ 18 යන වගන්ති ප්‍රකාරව සකස් කළ යුතු අතර එම ඉල්ලුම් පත්‍රය සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එම ඉල්ලුම් පත්‍රය මෙම නියෝගවල I වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතු ය.

3. අයදුම්කරු සංවිධානයක් වන අවස්ථාවක -

(1) පහත දැක්වෙන ලේඛන ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(අ) සංවිධානයේ ව්‍යවස්ථාවේ පිටපතක්,
(ආ) සංවිධානයේ අවසන් වාර්ෂික මහ සභා රැස්වීම් සටහනේ පිටපතක්,
(ඇ) ඉකුත් වර්ෂයේ සංවිධානයේ ගිණුම් ප්‍රකාශයේ පිටපතක්,
(ඈ) සංවිධානය විසින් සලසනු ලබන සේවා සහ ආධාර පිළිබඳ වාර්තාවක්, සහ
(ඉ) ලියාපදිංචි කිරීමට අපේක්ෂිත ආයතනය පිහිටි බල ප්‍රදේශය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් වාර්තාවක්.

(2) සෑම ඉල්ලීමක් ම නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතු අතර එය සංවිධානයේ ලේකම්වරයා විසින් අත්සන් කර තිබිය යුතු ය.

4. ඉල්ලුම්කරු තැනැත්තෙකු වන අවස්ථාවක-

(1) පහත දැක්වෙන ලේඛන ඉල්ලීමක් සමග ඉදිරිපත් කළ යුතු ය-

(අ) එම තැනැත්තා විසින් සලසනු ලබන සේවා සහ ආධාර උපකාරයන් පිළිබඳ වාර්තාවක්,
(ආ) පිළිගත් තැනැත්තන් දෙදෙනෙකු විසින් නිකුත් කරනු ලබන නිර්දේශ ලිපි දෙකක්,
(ඇ) එම තැනැත්තාගේ ආදායම්, වත්කම් හා වගකීම් පිළිබඳ වාර්තාවක්, සහ
(ඉ) ලියාපදිංචි කිරීමට අපේක්ෂිත ආයතනය පිහිටි බලප්‍රදේශය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබා ගත් වාර්තාවක්.

(2) සෑම ඉල්ලීමක් ම නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතු අතර ආයතනය භාර තැනැත්තා විසින් අත්සන් කර තිබිය යුතු ය.

5. මේ පනත ප්‍රකාරව ලියාපදිංචි වී ඇති සෑම සංවිධානයක් ම හෝ තැනැත්තෙකු වෙත පනතේ 18 වැනි වගන්තිය මගින් නියම කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එම සහතිකය මෙම නියෝගවල II උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූල විය යුතු ය. ලියාපදිංචි කිරීමේ සහතිකයක් පැවරිය නොහැකි ය.

6. (1) සෑම ලියාපදිංචි තැනැත්තෙකු සහ ලියාපදිංචි සංවිධානයක් විසින් ම ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සලසා ඇති ආයතනයට අදාළව සභාව විසින් කරනු ලබන විධානවලට අනුකූලව පහත දැක්වෙන ලේඛන පවත්වාගෙන යා යුතු ය.

(i) බැංකු ගිණුම් සහිත මුදල් පොත,
(ii) සුළු මුදල් පොත,
(iii) ප්‍රධාන ලෙජරය,
(iv) ප්‍රධාන ජර්නල් පොත,
(v) සාමාජික නාම ලේඛනය,
(vi) සාමාජික ගාස්තු ලේඛනය,
(vii) ගෙවීම් වවුචර්,
(viii) ණයකරුවන්ගේ සහ ණය හිමියන්ගේ ලෙජරය,
(ix) රිසිට් පොත්,
(x) වත්කම් ලේඛනය,
(xi) කාරක සභා රැස්වීම්වල සහ මහ සභා රැස්වීම්වල සටහන් ඇතුළත් පොත්,
(xii) ආයතනය තුළ නේවාසික රැකවරණ ලබමින් සිටින නේවාසික වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නාම ලේඛනයක්,
(xiii) කාර්ය මණ්ඩල විස්තර ඇතුළත් ලේඛනය, සහ
(xiv) අදාළ පනත්, නියෝග සහ රීති ඇතුළත් ලිපිගොනු

(2) (1) වැනි ඡේදයේ (v) වැනි (vi) වැනි සහ (xi) වැනි අනු ඡේදවල විධිවිධාන ලියාපදිංචි සංවිධානයක් සම්බන්ධයෙන් පමණක් අදාළ විය යුතු ය.

7. (1) සෑම ලියාපදිංචි තැනැත්තෙකු හෝ ලියාපදිංචි සංවිධානයක් විසින් ම, අවස්ථාවෝචිත පරිදි-

(අ) සභාව විසින් කලින් කළ නිකුත් කරනු ලබන විශේෂ හෝ සාමාන්‍ය විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය ;
(ආ) ඒ තැනැත්තාගේ හෝ සංවිධානයේ ආදායම සහ වියදම, වත්කම් හා වගකීම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි පරිදි ගිණුම් පවත්වාගෙන යා යුතු ය ;

(ඈ) මහ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් ක්‍රමානුකූලව පවත්වාගෙන යා යුතු ය ;

(ඇ) පනතේ අවධාරණය කර ඇති අරමුණුවලට සහ ඒ තැනැත්තා වෙත හෝ සංවිධානය වෙත ඇති අරමුදල්වලට සරිලන පරිදි ව්‍යාපෘති සහ වැඩසටහන් හඳුනාගෙන ඒවා සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය ; සහ

(ඉ) වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමෙන් එක් මසක් ඇතුළත, වාර්ෂික මහ සභා රැස්වීමේ සටහන් සමග අදාළ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ සහ වාර්ෂික ප්‍රගති වාර්තා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වැනි ඡේදයේ (ඈ) අනු ඡේදයේ විධිවිධාන අනුමත සංවිධානයක් සම්බන්ධයෙන් පමණක් අදාළ විය යුතු ය.

8. ආයතනයක් ලියාපදිංචි කිරීමෙන් පසු, පසුව එළඹෙන සෑම වර්ෂයකම ජනවාරි මස 31 වැනි දිනට පෙර එම ආයතනය තුළ සිටින නේවාසික වැඩිහිටි තැනැත්තන් පිළිබඳ පහත දැක්වෙන තොරතුරු සෑම අනුමත තැනැත්තෙකු සහ අනුමත සංවිධානයක් විසින් ම සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(1) (අ) ලියාපදිංචිය සඳහා ඉල්ලුම්කරන අවස්ථාවේදී නේවාසිකව සිටින වැඩිහිටි තැනැත්තන්ගේ නාම ලේඛනයේ සහතික පිටපතක්,

(ආ) සෑම වර්ෂයකම ජනවාරි 01 වැනි දින ආයතනය තුළ සිටින නේවාසික වැඩිහිටි තැනැත්තන්ගේ නාමලේඛනයේ සහතික පිටපතක්,

(ඇ) එම වර්ෂයට ඉහතින් ම වූ, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මියගිය නේවාසික වැඩිහිටි තැනැත්තන්ගේ නාමලේඛනයේ සහතික පිටපතක්.

(2) සෑම වර්ෂයකම ජනවාරි 01 වැනි දින සේවයේ නියුක්තව සිටි කාර්ය මණ්ඩලයේ සුදුසුකම් පිළිබඳ වාර්තාවක්.

9. වැඩිහිටි තැනැත්තන් සඳහා මුදල් අයකිරීමේ පදනම මත නේවාසික රැකවරණ සැලසීම අපේක්ෂාවෙන් යම් ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් ම -

(අ) එම වර්ෂය ඇතුළත එක් මසකට අය කරනු ලබන මුදල ; සහ

(ආ) එහි සිටින නේවාසිකයන් සඳහා වර්ෂය තුළ දී ලබා දීමට අදහස් කර ඇති පහසුකම්.

සඳහන් කරමින් ප්‍රකාශයක් සෑම වර්ෂයක ම ජනවාරි මස 31 හෝ ඊට ප්‍රථම සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

10. වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සැලසීමේ ආයතනයක නේවාසිකයෙකු වශයෙන් එක් වසරකට වැඩි කාලයක් සිටි කිසිදු නේවාසික වැඩිහිටි තැනැත්තෙකු එම ආයතනයෙන් ඉවත් නොකළ යුතු ය.

එසේ වුව ද, යම් නේවාසික වැඩිහිටි තැනැත්තකු වෙනත් වැඩිහිටි නිවාසයකට මාරුකිරීමේ කාර්ය සඳහා එම වැඩිහිටි තැනැත්තාගේ ලිඛිත කැමැත්ත ඇතිව පමණක් එම වැඩිහිටි තැනැත්තා එම ආයතනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි කැමැත්තක් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් සහතික කළ යුතු ය.

11. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරයා, ප්‍රාදේශීය ලේකම්වරයා, සමාජ සේවා නිලධාරි, සමාජ සංවර්ධන සහකාර, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර හෝ සභාවේ ලේකම් විසින් ලිඛිතව බලය පවරනු ලැබූ ඕනෑම තැනැත්තෙකු හට ඕනෑම සාධාරණ අවස්ථාවක පෙර දැනුම්දීමකින් තොරව වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සපයනු ලබන හෝ සපයනු ලැබීමට අරමුණු කර ගත් ඕනෑම ආයතනයකට ඇතුළුවීම සහ පරීක්ෂා කිරීමට හැකි ය.

12. අවස්ථාවෝචිත පරිදි, සෑම අනුමත තැනැත්තෙකු සමග අනුමත සංවිධානයක් විසින් එම තැනැත්තා පදිංචිව සිටින හෝ එම සංවිධානය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාව සෑම මාස හයකට ම වරක් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

13. මේ පනත යටතේ රීති සහ නියෝගවලට අනුකූලව සිය කර්තව්‍ය ඉටු කිරීම යම් ආයතනයක් විසින් පැහැර හරිනු ලැබූ යම් අවස්ථාවක වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් විමර්ශනයක් කිරීමෙන් පසු සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරයා, ප්‍රාදේශීය ලේකම්වරයා, සමාජ සේවා නිලධාරි, සමාජ සංවර්ධන සහකාර, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර යන නිලධරයන් විසින් හෝ සභාවේ ලේකම්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ සලකා බැලීමෙන් පසු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් එම ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

14. වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සැලසීම සඳහා අපේක්ෂිත ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යනු ලබන සෑම අනුමත තැනැත්තෙකු හෝ අනුමත ආයතනයක් විසින් ම, සභාව විසින් එම ආයතනය වෙනුවෙන් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය ආයතනයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

15. (1) 2001 ජූනි මස 25 දිනැති අංක 1190/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2000 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

(2) 2000 වර්ෂයේ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නියෝග අවලංගු කිරීම නොතකා, මේ නියෝග බලාත්මක වීමේ දිනයට පෙර සභාව විසින් නිකුත් කරනු ලැබ එම දිනය වන විට බලාත්මකව පවතින ලියාපදිංචි කිරීමේ සහතික එම දිනයේ සිට මාස හයක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය. එම දිනයේ දී ලියාපදිංචිව සිටින සෑම තැනැත්තෙකු හෝ සංවිධානයක් ම මේ පනතේ විධිවිධාන යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සලසන ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීමට යටත්ව සිටින්නේ නම් එම තැනැත්තා හෝ සංවිධානය විසින් නව ලියාපදිංචියක් සඳහා ඉල්ලුම් කළ යුතු ය.

16. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2011 අංක 05 දරන පනතින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත අදහස් වේ.

"අනුමත තැනැත්තා" හෝ "අනුමත සංවිධානය" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි පනතේ 18 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තෙකු හෝ සංවිධානයක් අදහස් වේ.

"සභාව" යන්නෙන්, පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව අදහස් වේ.